මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்லிக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පෙරදිග සංගීතය I | 8 ශ්‍රේණිය | කාලය : පැය 02 |
|---|---|---|

**අංක 01 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

**01.** ආරෝහණයේ සහ අවරෝහණයේ ශුද්ධ ස්වර 7 ම යෙදෙන රාගය වන්නේ

1. භූපාලි 2. යමන් 3. බිලාවල් 4. කාෆි

**02.** ගමප ගමරි ස ලෙස ස්වර යෙදෙනුයේ

1. යමන් රාගයේය. 2. බිලාවල් රාගයේය.
3. කාෆි රාගයේය. 4. භූපාලි රාගයේය.

**03.** ධ ග ලෙසින් වාදී සංවාදී යෙදෙන රාගය වන්නේ

1. බිලාවල් 2. භූපාලි 3. යමන් 4. කාෆි

**04.** තාලයක කුඩාම ඒකකය

1. ලය යි. 2. මාත්‍රා යි. 3. තාලය යි. 4. ප්‍රභේද යි.

**05.** භූපාලි රාගයට අයත් ගී පාදය වන්නේ

1. සිරිසාර අති ශාන්ත 2. සිරස නමමු මව් පොළොවට
3. ඇහැළ මහට ඇහැල ගහක. 4. ගතෙහි රුහිරු පෙම

**06.** සිතාරයේ ප්‍රධාන තත හඳුන්වන නාමය වන්නේ

1. මිස්රාබ් 2. නායකී තාර් 3. පර්දා 4. තුම්බා

**07.** ත්‍රිතාලයේ ඛලි ස්ථානය පිහිටන මාත්‍රාව වන්නේ

1. 5 2. 6 3. 7 4. 9

**08.** සරිගම, රිගමප, යන ස්වර අභ්‍යාසයේ ඊළගට යෙදෙන ස්වර ඛණ්ඩය වන්නේ

1. ගමපධ 2. මපධනි 3. පධනිසං 4. ධනිසංනි

**09.** / x x / x x x / x x / x x x / මෙම රිද්ම රටාවට මාත්‍රා කැටි වන හින්දුස්ථානී තාලය

1. ත්‍රිතාලය 2. දාදරා 3. ජප් තාලය 4. දීප් චන්දි

**10.** හින්දුස්ථානී තාල පද්ධතියේ තාලයක ප්‍රබල ස්ථානය හිමිවන සංකේතය

1. x ය. 2. 0 ය. 3. 2 ය. 4. 3 ය.

11. අලුවෙන් වයනු ලබන සංගීත භාණ්ඩයක් වන්නේ

1. සිතාරය 2. එස්රාජය 3. ගිටාරය 4. සර්පිනාව

12. වර්තමානයේ ශ්‍රී ලංකාවේ දක්ෂ එස්රාජ් වාදකයෙකු වන්නේ

1. ධර්මසේන ගී කියනගේ 2. එඩ්වින් සමර දිවාකර

3. පියදාස අතුකෝරළ 4. නිශාද් හඳුන්පතිරණ

13. සරල ගීතයක ආකෘතිය වන්නේ

1. ස්ථායි, අන්තරා, පෙර වාදන, අතුරු වාදන

2. පෙර වාදන, අතුරු වාදන, ස්ථායි, අන්තරා

3. පෙර වාදන, ස්ථායි, අතුරු වාදන, අන්තරා

4. අතුරු වාදන, ස්ථායි, පෙර වාදන, අන්තරා

14. " උදයට පායන හිරු දෙවියන්ටයි" යන ගී පාදය ගැයෙන තිත වන්නේ

1. මහ තනි තිත 2. මැදුම් තනි තිත 3. සුලු තනි තිත 4. මැදුම් මහ දෙතිත

15. "බෝ දොස් කියා මාගෙ" යන නූර්ති ගීතයට වාදනය සඳහා යොදා ගත හැකි හින්දුස්ථානී තාලය වන්නේ

1. ත්‍රිතාලය 2. දාදරා 3. බෙම්ටෝ 4. කෙහෙර්වා

හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(භජන්, තබ්ලාව , නෙලුම්, මෙහෙ ගී, අම්මා සඳකි )

16. තෙල් ගාලා හිස පීරන් නෑනෝ ........................................... ගීයකි.

17. නූර්ති ගීත ගායනය සඳහා ................................................භාවිතා කරයි.

18. මීරා බායි .................................. ගීත ගායිකාවකි.

19. කමත් ගී ..........................................විශේෂය කි.

20. ...................................... පියගුණ ඇතුලත් ගීතයකි. (ල.2 x 20 = 40 )

## II  කොටස

## පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05 ට පිළිතුරු සපයන්න.

**01.** බිලාවල් රාගාශ්‍රිත ගීතයේ තිත් සහිත හිස්තැන් වලට සුදුසු ස්වර යොදා හිස් තැන් පුරවන්න. (ල. 08 )

/ ග  ම  ප / ග  ම  රි / ස  රි  ග / ..  ..  .. /

/ ස  ග  ග / ..  ..  .. / ග  ම  ධ / ප  -  - /

/ ප  -  ප / නි  ධ  නි / ..  ..  .. / ස̇  ස̇  - /

/ නි  ධ  නි / ..  ..  .. / නි  ස̇  ධ / ප  -  - /

/ ප  ධ  නි / ස̇  රි̇  රි̇ / ..  ..  .. / ..  ..  .. /

/ ..  ..  .. / ම  ප  ප / ග  ම  රි / ස  -  - /

**ii.** ඉහත රාගයේ ස්වර සංගති 02 ක් ගීතය ඇසුරින් ලබා දෙන්න. (ල. 04 )

**02.** / ධා  ධිං  ධිං  ධා / ධා  ධිං  ධිං  ධා / ධා  තිං  තිං  තා / තා  ධිං  ධිං  ධා /

**i.** ඉහත තාලය නම් කරන්න. (ල. 02 )

**ii.** එම තාලය නිවැරදි තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 04 )

**iii.** එම තාලයට ගැලපෙන තිත් රූපයේ නම ලියන්න. (ල. 02 )

**iv.** එම තිත් රූපයේ බෙර පදය ප්‍රස්තාර කරන්න. (ල. 04 )

**03.** **i.** එස්රාජය නිර්මාණය කරන ලද්දේ කවුරුන්ද (ල. 02 )

**ii.** එස්රාජයේ ප්‍රධාන තත හඳුන්වන නම ලියන්න. (ල. 02 )

**iii.** එස්රාජයේ ස්වර පිහිටීමට සමාන ස්වර පිහිටන භාණ්ඩයේ නම ලියන්න. (ල. 02 )

**iv.** එස්රාජයේ රූපසටහනක් ඇද කොටස් තුනක් නම් කරන්න. (ල. 06 )

**04.** **A.** රන් දැකැති ගෙන නිති සැරසෙනවා  **B.** මේ කොතනින් ගෙනා ගොනා

**i.** ඉහත A සහ B අක්ෂර වලින් දැක්වෙන ගී වර්ග 02 පිළිවෙලින් නම් කරන්න. (ල. 02 )

**ii.** ඉන් ඔබ වඩාත් කැමති ගී වර්ගයට අයත් ගීයක් ලියා දක්වන්න. (ල. 04 )

**iii.** ගැමි ගී වල විශේෂ ලක්ෂණ 4 ක් ලියන්න . (ල. 04 )

**iii.** ගැමි ගී බෙදෙන කොටස් 02 ක් ලියන්න (ල. 02 )

**05.** පහත දැක්වෙන්නේ රංග සම්ප්‍රදායන් දෙකකට අයත් තොරතුරුය.

A. හින්දුස්ථානී සංගීත ආභාෂය ලැබී ඇත. B. මද්දලය වාදනය කරයි.

C. කර්ණාටක සංගීතය යොදා ගනී. D. තබ්ලාව තාල වාද්‍ය භාණ්ඩය වේ.

E. බලිවාලා ප්‍රමුඛ නෘත්‍ය කණ්ඩායම ආරම්භ කරන ලදි.

F. වෙස්සන්තර පද්මාවතී ප්‍රචලිත නාට්‍ය දෙකකි.

i. ඉහත දැක්වෙන රංග සම්ප්‍රදායන් 02 නම් කරන්න. (ල. 02 )

ii. ඉහත තොරතුරු ඒ ඒ රංග සම්ප්‍රදායන් 02 යටතේ වගු ගත කරන්න. (ල. 06 )

iii. එම රංග සම්ප්‍රදායන් සඳහා භාවිතා කරන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ 02 නම් කරන්න. (ල. 04 )

**06.** පහත දැක්වෙන්නේ බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ භාවිතා වන ස්වර සංකේත වලට හිමි නාම වේ.

A. සෙමිබ්‍රිව් B. මිනිම්

C. ක්‍රොචට් D. ක්වයවර්

i. ඉහත දැක්වෙන නම් වලට අදාළ සංකේත දක්වන්න. (ල. 04 )

ii. බටහිර රේඛා මණ්ඩලයක ස්වර සප්තකය ලකුණු කරන්න. (ල. 04 )

iii. පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට ලියා දක්වන්න. (ල. 04 )

/ ස ස ස / රි රි රි / ග - රි / ස - - /

/ ස - ස / රි - රි / ග - ග / ම - - /